# කාමය, ලිංගිකත්වය හා නිර්වාණගාමී ප්‍රතිපදාව පිළිබඳ අධ්‍යයනයක්.

චමින්දජී ගමගේ

ලියාපදිංචි අංකය: 2002 Ph.D. 672

දර්ශන විශාරද උපාධිය සඳහා කැලණිය
විශ්වවිද්‍යාලයානුබද්ධ පාලි හා බෞද්ධ අධ්‍යයන
පශ්චාත් උපාධි ආයතනය වෙත ඉදිරිපත් කරනු ලබන
පර්යේෂණාත්මක නිබන්ධය.

*2004* – ජූලි

උපදේශක :

මහාචාර්ය තිලක් කාරියවසම් මහතා

# සංක්ෂිප්තය

බුදුදහම යනු විශේෂ ධර්ම පද්ධතියක් සහ ඊට අනුකූල වූ චරණ පද්ධතියක් ප්‍රකාශ කරන්නකි. ධර්මය තුලින් සත්‍වයා පිලිබඳවත්, සත්‍වයා අවට ඇති පරිසරය පිලිබඳවත් යථාර්ථය පැහැදිලි කරන අතර චරණ පද්ධතිය තුලින් සත්‍වයාගේ පරම නිෂ්ටාව වූ විමුක්තිය කරා යොමු කරවීම සිදුකරයි. බුදු දහමෙහි මූලික පරමාර්ථය සත්‍වයාට සංසාරික ජීවිතයෙහි යථාර්ථය අවබෝධ කර දී ඉන් මිදී පරම නිෂ්ටාව ලබාගැනීමේ මාර්ගය පහදා දීම වුවත් ඒ තුල මිනිසාගේ ස්වභාවය, මිනිස් චර්යාව, මිනිස් සිතුවිලි, මිනිසාගේ අපේක්ෂා මෙන්ම මිනිසා වටා ගොඩ නැගී ඇති පරිසරය පිලිබඳව ආදී කොට ඇති බොහෝ කරුණු පිලිබඳව ද කරුණු ඇතුලත්ව ඇත. මිනිස් වර්ගයාගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාවලිය වූ ලිංගික ක්‍රියාකාරිත්වය මිනිස් ජීවිතයෙහි ප්‍රධානතම භූමිකාවක් වෙයි. එසේම මිනිසා පිලිබඳ පූර්ණ අවබෝධයක් ලබාගැනීමට ඔහුගේ ලිංගික චර්යාවන් පිලිබඳවද අධ්‍යයනය කල යුතු වෙයි.

මෙහිදී බුදුදහමෙහි උගන්වන විමුක්ති මාර්ගය තුල මිනිස් ලිංගික ක්‍රියාකාරිත්වයට හිමිවන තැන පිරික්සීම සිදුකෙරිනි. මිනිසා ජන්මයෙන්ම දායාදකොට ගෙන එන පස්කම් සැප විඳීමේ කැමැත්ත, දුකෙන් පිරි නොනවතින සංසාර ගමනෙහි මූලය ලෙස බුදුදහම පෙන්වා දෙයි. විමුක්තිය යනු දුක්ඛ දායක වූ මේ සංසාර ගමන නැතිකිරීමයි. ඒ අනුව බුදුදහමෙහි ඉගැන්වෙන විමුක්තිය ලබාගැනීමට ජන්මදායාදකොට ගෙන එන පස්කම් සැප විඳීමේ කැමැත්ත හෙවත් කාමය අත්හලයුතු වෙයි. පඤ්චකාම සම්පත්තියම එකවිට ලබන අවස්ථාවක් ලෙස ලිංගික චර්යාව හැඳින්වෙයි. එසේම ලිංගික චර්යාවට මිනිසා තුල ඇති කැමැත්ත ඉතා බලවත් පෙලඹවීම ලෙසද බුදුදහම හඳුනාගෙන ඇත. බෞද්ධ විමුක්තිය ලබා ගැනීම සඳහා මෙම බලවත් පෙලඹවීමෙනුත්, වින්දනය සඳහා ඇති කැමැත්තෙනුත්, සත්වයා ඉවත් විය යුතු බව බුදුදහම අවධාරණය කර ඇත.

මෙහිදී ප්‍රථමයෙන්ම කාමය හෙවත් කැමැත්ත පිලිබඳව සූත්‍ර පිටකයේ දැක්වෙන අදහස් විමසීමට ලක්කලෙමි. එහිද බුදුදහමෙහි විස්තර වන කාමය තුල ලිංගිකත්වයට

හිම්වන තැන පරීක්ෂාවට භාජනය කළෙමි. ලිංගිකත්වය කාමයෙහි මූලික අංගයක් වන අයුරු බොහෝ සූත්‍ර දේශනාවන්ගෙන් පැහැදිලවන අතර එය විමුක්ති මාර්ගයට ප්‍රධාන බාධකයක් ලෙස දක්වා ඇත. ඒ බව වඩාත් තහවුරු කරන සාධකයක් ලෙස විනය පිටකය දැක්විය හැකිය. නිවන් මගට පිළිපන් භික්ෂු භික්ෂුනීන් සඳහා පණවන ලද විනය නීති පද්ධතියෙහි, විමුක්ති මාවතට ප්‍රධාන බාධකයක් වන ලිංගික චර්යාවන් සඳහා ඔවුන්ට කිසිදු ඉඩක් තබා නොමැත. ඉන් ප්‍රකට වන්නේ සත්වයා දුක්ඛ දායක වූ සසරෙහි බැඳ තබන ලිංගික චර්යාවන් සඳහා බෞද්ධ විමුක්ති මාර්ගයෙහි අවකාශයක් නොමැති බවයි. බෞද්ධ විමුක්ති මාර්ගයෙහි ගමන් කර විමුක්තිය ලගා කරගත් රහතන් වහන්සේ කාමය හෙවත් කැමැත්ත යන සංකල්පයන්ගෙන් පූර්ණ වශයෙන් මිදී ඇති අයුරු සොපධිශේෂ නිර්වාණ ධාතුවෙන් නිවන් අවබෝධ කරගත් පිරිස් පිළිබඳව ත්‍රිපිටකයෙහි එන විස්තර වලින් ප්‍රකට වෙයි. මේ කරුණු අනුව බෞද්ධ විමුක්ති මාර්ගය තුළ ලිංගික චර්යාවන්ට පමණක් නොව ඒ සඳහා දක්වන කැමැත්තට ද (කාමය) කිසිදු අවකාශයක් නොමැති බව පැහැදිලි වෙයි.